# 18 එක ම දෙවියන් වහන්සේ තුළ විශ්වාසයේ ජීවිතයක්

හතරවන ඇන්ටිඕකස් එපිපානෙස් පාලන සමයේ දී විජාතික වත් පිළිවෙත් ඉටු කිරීමට මවට සහ දරු හත් දෙනාට බල කරන ලදි. එනමුදු එක ම දෙවියන් මත යැපුණු ඔවුන්, එම වත් පිළිවෙත්වල නොයෙදුණු නිසා ඔවුන් මරා දමන ලදි. එම මරණය අභිමුව මව දරුවන් ශක්තිමත් කළේ, "ඔබ මගේ කුස සිටියත්, මම කිරි දුන්නත්, හැදුවත්, වැඩුවත් ඔබ අයිති දෙවියන් වහන්සේට ය. ඒ නිසා නොබිය ව මරණයට ඉදිරිපත් වන්න. එවිට අප සැමට විනිශ්චය දවසේ දී ස්වාමීන් වහන්සේ මුණ ගැසෙයි" කියා ය. (2 මකබි 7)

මෙම කතා පුවත ඉහත බයිබල් පාඨය කියවීම මඟින් ඔබට තව දුරටත් වටහාගත හැකි ය. එයින් මිථ්‍යා ඇදහිලිවලට යටත් නොවිය යුතු බවත් එයින් අභියෝග හමුවේ නොබිය ව ස්ථිර ව සිටීමට ශක්තිය දෙවියන් වහන්සේගෙන් ලැබෙන බවත් අවධාරණය කරයි.

මිථ්‍යා ඇදහිලි දෙවියන් වහන්සේට ප්‍රසන්න ක්‍රියා නොවේ. එමෙන් ම ඒවා පළමුවන දේව පනතට විරුද්ධ ක්‍රියා ය. මිථ්‍යා ඇදහිලිවලින් ප්‍රසාද ස්නාපනය ලද කිතුනුවන් ඈත් විය යුතු ය.

## රූප වන්දනාවට විරුද්ධ අවවාද

ඔබේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබ අයිති කර ගන්නට යන දේශයෙහි ජාතීන් වනසා දමූ කල්හි ඔබ ඔවුන් පන්නාදමා, ඔවුන්ගේ දේශයෙහි පදිංචි වූ කල ඔබට කලින් විනාශ වී ගිය ඔවුන් පසුපස යෑමට නොරැවටෙන ලෙස හොඳින් වග බලා ගන්න. තවද, මේ ජාතීන් ඔවුන්ගේ දෙවිදේවතාවන්ට වැඳුම් පිදුම් කෙළේ කෙසේ ද 'මමත් එසේ කරමි' කියා ඔවුන්ගේ දෙවිදේවතාවන් ගැන විස්තර නොසොයන්න. ඔබ එසේ කළොත්, ඔබ ඔවුන් මෙන් වනු ඇත. ඔබ නම් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට එලෙස නොකළ යුතු ය. සමිඳාණන් වහන්සේ වෛර කරන සැම පිළිකුල් දෙයක් ම ඔවුන් තමන්ගේ දෙවිදේවතාවන් සම්බන්ධයෙන් කර ඇත. ඔව්හු තමන්ගේ දෙවිදේවතාවන් සඳහා ඔවුන්ගේ දරු දූරියන් පවා ගින්නේ පිළිස්සූහ. (ද්විතීය 12:29-31)

මේ පාඨය මගින් ඉශ්රායෙල් ජනතාවට අවවාද කරන්නේ පොරොන්දු දේශයේ ජීවත් විය යුතු ආකාරය පිළිබඳ ව ය. එහි දී කානානිවරුන්ගේ මිථ්‍යා ඇදහිලිවලින් බැහැර වන ලෙස උන්වහන්සේ අවවාද කරන සේක.

මනුෂ්‍ය පුත්‍රය, මේ මනුෂ්‍යයන් තමන්ගේ දේව රූපවලට සිය සිත් යොමු කර ඇත; ඔවුන්ගේ වැටීමට හේතු වන පාපිෂ්ඨ දේ දෙසට නෙත් යොමා ඇත. මාගෙන් විමසන්න ඔවුන්ට කොහෙත් ම ඉඩ දිය යුතු ද? එබැවින් ඔවුන් සමග කතා කර ඔවුන්ට කියන්න, මහෝත්තම දෙවි ස්වාමීන් වහන්සේ මෙසේ වදරන සේක. දේව රූපවලට සිය සිත් යොමු කර ගත්, ඔවුන්ගේ වැටීමට හේතු වන පාපිෂ්ඨ දෙයට නෙත් යොමු කර ගත් යම් ඉශ්‍රායෙල් ජාතිකයෙකු දිවැසිවරයා වෙත පැමිණිය හොත්, ඔහුගේ දේව රූප බහුල වීම නිසා ස්වාමීන් වන මම ම ඔහුට පිළිතුරු දෙන්නෙමි. මෙසේ කරන්නේ, මුළු ඉශ්‍රායෙල් වංශය තමන්ගේ දේව රූප කරණ කොට ගෙන මාගෙන් වෙන් ව ගිය බැවින් ඔවුන් ආපසු මා වෙත දිනා ගන්නා පිණිස ය.

(එසකියල් 14:3-6)

මෙයින් පෙන්වා දෙන්නේ, මිථ්‍යා ඇදහිලි දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව ය. දෙවිඳුන්ට පිළිකුල් කරන දෙයින්, වැළකී සිටිය යුතු ය. සැබෑ වූ එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු ය. බබිලෝනියාවේ වහලුන් වූයේ මිථ්‍යා ඇදහිලි අනුගමනය කළ නිසා ය.

බොරු දේව පිළිම වෙත නොහැරෙන්න; ලෝහයෙන් වාත්තු කළ දෙවිවරුන් සාද නොගන්න, නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි.

(ලෙවී 19:4)

වෙනත් ආගමිකයන් භාවිත කරන පිළිම දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව මෙම පාඨය පෙන්වා දෙයි.

ඔබ අතර දිවැසිවරයෙකු හෝ ස්වප්න තෝරන්නෙකු හෝ පහළ වී, ඔබට හාස්කමක් හෝ අරුම පුදුම දෙයක් හෝ පාන්නට යෝජනා කොට, ඔහු කී අයුරින් ඒ හාස්කම් හෝ අරුම පුදුම දේ හෝ සිදු වී ඔබ නොහඳුනන අන් දෙවි දේවතාවන් පසුපස ගොස්, "අපි ඔවුන්ට වැඳුම් පිදුම් කරමු"යි කීවොත්, එවැනි දිවැසිවරයෙකුගේ හෝ ස්වප්න තෝරන්නෙකුගේ හෝ කීම්වලට ඔබ සවන් නොදිය යුතු ය. මෙවැනි දේවලින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් සහ

ඔබේ මුළු සිතින් ප්‍රේම කරන්නහු ද යි උන්වහන්සේ ඔබ පරීක්ෂා කරන සේක. ඔබ හැම, දෙවි සමිඳාණන් වහන්සේ අනුව ගොස්, ගරුබිය දක්වා, උන්වහන්සේගේ ආඥා ආරක්ෂා කොට, හඬට කීකරු වී උන්වහන්සේට වැඳුම් පිදුම් කොට, ඇළුම් ව සිටිය යුතු ය.

(ද්විතීය 13:1-4)

ඉහත පාඨයට අනුව බොරු දිවැසිවරයෙකුගේ හෝ ස්වප්න තෝරන්නෙකුගේ හෝ කීම්වලට සවන් නොදිය යුතු ය. මුළු හෘදයෙන් ද මුළු සිතින් ද දෙවියන් වහන්සේට පමණක් ගරුබිය දක්විය යුතු ය. දෙවියන් වහන්සේගේ ආඥා ආරක්ෂා කළ යුතු ය. ඔවුන් වහන්සේගේ හඬට කීකරු වී, උන්වහන්සේට පමණක් වැඳුම් පිදුම් කොට, ප්‍රේම කළ යුතු ය.

විශ්වාසයට විරුද්ධ ව නිරන්තරයෙන් පැන නගින පරීක්ෂා පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු ය. මුදල, බලය, වස්තුව ආදි ලෞකික දේවලට දෙවියන් වහන්සේට දිය යුතු තැන දීම නුසුදුසු ය. දෙවියන් වහන්සේට හා ලෞකික දේවලට ආදරය කළ නොහැකි ය. ප්‍රාණපරිත්‍යාගීවරුන් බොහෝ දෙනෙකුට දිවි පිදීමට සිදු වූයේ ඒක දේවවාදී විශ්වාසයක් මත ජීවත් වූ නිසා ය. රූප වන්දනාවෙන් ඒක දේවවාදය ප්‍රතික්ෂේප කෙරේ.

කතෝලික විශ්වාසයට අනුව නැකැත් බැලීම, බලි තොවිල්, ලග්න පලාපල, යන්ත්‍ර මන්ත්‍ර, ශාස්ත්‍ර ඇසීම, ගුරුකම්, පේන බැලීම, හූනියම් හා දෙහි කැපීම ආදිය ද මිථ්‍යා ඇදහිලි වේ. එමෙන් ම තව දුරටත් එදිනෙද ජීවිතයේ පවතින මිථ්‍යා විශ්වාස වන, ගමනක් යන විට හෝ සුබ දෙයක් කතා කරන විට හූනා "චික් චික්" යැයි කෑ ගැසීම අසුබ යැයි කීම, ගමනක් යන විට හිස් කළයක්, දරමිටියක්, කොස්සක් හෝ ඉදලක් අතැති කෙනෙක් දුටු විට අසුබ බව විශ්වාස කිරීම, වැන්දඹුවක් සුබ කටයුතු සඳහා සහභාගි කරවා ගැනීම අසුබ යැයි විශ්වාස කිරීම, ගමනක් යන විට පූසෙකු යන මඟ හරහට පැනීම අසුබ යැයි සිතීම, අඟහරුවාද, සිකුරාද වැනි දිනවල මෙන් ම මළවුන්ගේ මාසය යැයි නම් කරන ලද නොවැම්බර් මාසයේ සුබ කටයුතු කිරීම අසුබ යැයි සිතීම වැනි කරුණු දෙවියන් වහන්සේට අප්‍රසන්න ක්‍රියා ය. පෙබරවාරි මාසයේ සුබ කටයුතුවල නොයෙදීම, ධනය, බලය, සුබ විහරණය, ජාතිවාදය, කුලය, පරම්පරා පිළිබඳ පම්පෝරි කීම ආදිය දෙවියන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන දේවල් ය. ශුද්ධ බයිබලයෙන් බොරු දිවැසිවරුන්ගේ හාස්කම් හා ස්වප්නවලට නොරැවටෙන ලෙස දෙවියන් වහන්සේ උපදෙස් දුන් සේක.

දෙවියන් වහන්සේට සමීප වීමට කළ යුතු දෑ;

- එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු ය.
- ඒක දේව වන්දනාවෙන් දේව සබඳතාව වර්ධනය කර ගත යුතු ය.
- මිථ්‍යා ඇදහිලිවලින් වැළකී, අන් අය ද ඉන් බේරා ගත යුතු ය.
- දෙවියන් වහන්සේ මත පමණක් යැපෙමින් ජීවිත අභියෝගවලට මුහුණ දීමට වගබලා ගත යුතු ය.
- යක්ෂ, භූත මායම් ඇති බව විශ්වාස නොකළ යුතු ය.
- මෙලොව ඇති සියලු ම දෑ දෙවියන් වහන්සේ ඉදිරියේ දූවිල්ලකට සමාන බව පිළිගත යුතු ය.

**ක්‍රියාකාරකම**

1. එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම සඳහා කළ යුතු දෑ ලැයිස්තු ගත කරන්න. (කරුණු පහක් සෑහේ)
2. එදිනෙද ජීවිතයේ දී ඔබ ප්‍රතික්ෂේප කළ යුතු මිථ්‍යා ඇදහිලි පහක් ලියන්න.
3. "මිථ්‍යා ඇදහිලි පිටු දකිමු" යන මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කරන්න.



**ජීවිතයට බිඳක්**

*මිථ්‍යා ඇදහිලිවලින් වැළකී දෙවියන් වහන්සේ පමණක් විශ්වාස කරමු.*